

ජගත් ජේ එදිරිසිංහ

# කටු 16

හැකිය. එසේ වුවද නැවත නිරාශාගේ මුහුණ බලන්නේ කෙසේද? ඇය තමා පිළිබඳ කුමක් සිතනු ඇතිද යන පැනය සිතට නැගෙත්ම සිතේ ඇවිලගත් කෝපාග්නිය දරා ගත නොහැකි ලෙස වැඩෙනු ඔහුට දැනෙයි.

තමා ඇසුරු කළ වෙනත් කාන්තාවක සම්බන්ධයෙන් මෙවන් කතාවක් කිසිවකු ගොඩනැගුවේ නම් ඔහුට ඒ පිළිබඳව සැහැල්ලුවෙන් සිතිය, කතා කළ හැකිව, තිබුණි. එය විනෝදයක් කරගන්නටද තිබුණි. එසේ වුවද නිරාශා සම්බන්ධ කර මෙවන් කතාවක් ගොඩනැගීම අතිශය බැරෑරුම් කාරණයකි. ඇය පිළිබඳව ඔහු සිතේ වූයේ ගෞරවාන්විත බැඳීමක් පමණකි. එය අනියම් සබඳතාවක් යයි හඳුන්වනු ලැබන තැනකට ඇද දැමීම කිසිවකු විසින් කරන ලද අතිශය කුරිරු ක්‍රියාවකි.

මෙය ඉතා අවදානම් මොහොතක් බව ඔහුගේ සිත කියයි. ඉදිරියට ක්‍රියා කළ යුත්තේ ඉතා කල්පනා-වෙන් බව ඔහුට දැනෙයි. පාලන තන්ත්‍රය හා සුවි-ශේෂ සම්බන්ධතා ඇති තමාද ගැට ගසා මෙවන් කතාවක් නිර්මාණය කරන්නට කිසිවකු උත්සාහ ගෙන ඇත්තේ ආවාට ගියාට නොවන බව තේරුම්ගන්නට අතිවිශාල බුද්ධියක් අවශ්‍යවන්නේ නැත. එවැන්නක් කළ හැකි වන්නේ එවැනිම බලයක් ඇති අයකුටම පමණකි.

කළ යුත්තේ කුමක්දැයි හසන්තගේ සිතට එකවරම නොඑයි. යම් ක්‍රියාමාර්ගයකට යන්නට පෙර කිසිවකු සමග සාකච්ඡා කිරීම සුදුසු වුවත් ඒ සඳහා සුදුසු කිසිවකු ඔහුට සිහිපත් නොවෙයි. සියල්ලට පළමුව නිරාශා හමුවිය යුතු යයි ඔහු අවසන තීරණය කළේය.

000000000000000000

“විදුලට පහර දීම පිටුපස ප්‍රහල හස්තයක්..” සති අන්ත විකල්ප පුවත්පතේ ප්‍රධාන ශීර්ෂපාඨය දෙ මදාරා බලා සිටියාය. මේ අදහසම තවත් සමහර පුවත්පත් නොකියා කියා තිබෙන බවද ඇය දැන සිටියාය.

“කෙළින් ලියන්න පත්තරකාරයො බයයි.. ඒක උන්ම දාගත්ත ස්වයං වාරණයක්..” සිසිර කුලසේකර කීවේ මදාරා පුවත්පත් පෙරළමින් සිටියදීය. “.. මිනිස්සු.. විශේෂයෙන් පත්තරකාරයො මේ තරම් හීලෑ වෙලා හිටිය යුගයක් මට මතක නැහැ.. අචිචර භීෂණයක් තිබුණ ප්‍රේමදාසගෙ කාලෙදිත් - ප්‍රේමදාස අපි ලෑස්තියි - කියල පත්තර හෙඩ්ම් දාන්න තරම් ශක්තියක් තිබුණ සුනිල් මාධව වගේ පත්තරකා-ාරයො හිටියා.. අද කව්ද ඉන්නෙ..?” ඔහු ඌණපූරණයක්ද එක් කළේය.

විදුලට එල්ල වුණ ප්‍රහාරය පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් ඉල්ලා විද්වත් පිරිසක් විසින් අත්සන් කළ සන්දේශයට සිසිර කුලසේකරද අත්සන් කළ බව මදාරා දැන සිටියාය. ඒ සන්දේශය විකල්ප පුවත්පත් කීපයක සම්පූර්ණයෙනුත් තවත් සති අන්ත පුවත්පත් කීපයක ප්‍රවෘත්තියක් වශයෙනුත් පළකර තිබුණි. විශ්ව විද්‍යාල ආචාර්ය සංගම් සහ කලාකරුවන් පිරිසක් විසින්ද වෙන වෙනම විරෝධය පළ කර තිබෙණු ද මදාරා දුටුවාය.

සවස රූපවාහිණිය ඔස්සේ පොලිස් ප්‍රකාශයක් ඉදිරිපත් කෙරුණේ සැම අතින්ම නැග එමින් තිබූ විරෝධය සමහන් කිරීමේ උපක්‍රමයක් වශයෙන් විය යුතු යයි මදාරා සිතුවාය. එහෙත් ඒ ප්‍රකාශයේ ගැබ්ව තිබූ විසකුරු ප්‍රහාරය මදාරා තැති ගන්-වන්නට සමත්විය.

“චිත්‍රපට අධ්‍යක්ෂ විදුල මුණසිංහට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් සැක පිට අසංග විතානගේ නම් අය අත්අඩංගුවට ගෙන ඇත. ප්‍රහාරයට මුල් වී ඇත්තේ අනියම් ප්‍රේම සම්බන්ධයක් බව දැනට කරගෙන යන පරීක්ෂණ හෙළි කරයි. අසංග විතානගේ යන අයගේ විශ්ව විද්‍යාල පෙම්වතියව සිටි තැනැත්තිය හා චිත්‍රපට අධ්‍යක්ෂවරයා අතර ඇතිවී තිබූ අනියම් ඇසුර හේතුවෙන් එයට පළිගැනීම සඳහා තමන් මේ ප්‍රහාරය සැළසුම් කළ බව අත්අඩංගුවට පත් පුද්ගලයා පාපොච්චාරණය කර ඇත. විදුල මුණසිංහගේ බිරිඳ වන චිත්‍රපට නිළිය ඇගේ නවතම චිත්‍රපටයේ නිෂ්පාදකයා වන ධනවත් ව්‍යාපාරිකයා සමග ඇති කරගෙන ඇති සම්බන්ධය නිසා විදුලගේ විවාහය බිඳ වැටී තිබුණ බවද පරීක්ෂණ කණ්ඩායම සොයාගෙන ඇත. රාජ්‍ය නොවන සංවිධානයක ඩොලර් වලට සේවය කරන විදුල එම සංවිධානය හරහා අසංග නමැත්තාගේ පෙම්වතිය හා සම්බන්ධයක් ඇති කරගෙන ඇති අතර අසංග නමැත්තා පුද්ගලයන් කීපදෙනෙකුට මුදල් ගෙවා ප්‍රහාරය සිදුකරවා ඇති බව මේ දක්වා ඔහු කළ පාපොච්චාරණයෙන් පෙනී යයි.. මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ සිදුකෙරෙමින් පවතියි”

“නීතියෙන් වරද කරුවන් බවට ප්‍රකාශ නොකෙරුණ පුද්ගලයන් සම්බන්ධයෙන් ඔබ කරන මේ ප්‍රකාශය නීති විරෝධී නොවේද?” යි විකල්ප පුවත්පතක වාර්තාකරුවකු ඇසූ ප්‍රශ්නයත් එයට පොලිස් ප්‍රකාශකයා දුන් පිළිතුරත් කිසිදු මාධ්‍යයකින් ප්‍රචාරය නොවුණි. එය සැළකිල්ලට ගත යුතු වැදගත් කරුණක් යයි කිසිවකු නොසැළකුවා සේය.

“මේක මහ හෙණ ගහන කතාවක්නෙ..” සිසිර කුලසේකර කීවේ කෝපයෙනි. “.. කව්ද මේ අසංග කියන්නෙ..?”

“අසංග... අහිංසක අසංග..” මදාරා සිතින් කීවාය. අවුල් වූ බොකුටු කොණ්ඩය අතින් සකසමින් රතු විසල් දෑසින් තමා දෙස බලා සිටි අහිංසක තරුණයා ඈ සිතින් මවා ගත්තාය. තිසර සූරියබණ්ඩාර හා සම්බන්ධ සිදුවීම් විශ්ව විද්‍යාලය පුරා පැතිර යද්දී කෝපයෙන් තමාට බැණ වැදුණ තරුණයා පිළිබඳ මතකය කෙළස නම් අමතක වන්නද? තමා පිළිබඳ බැඳුණ සිත සඟවා ගනිමින් වසර ගණනාවක් තමා අවට දැවටෙමින් සිටි තරුණයා කෙළෙස නම් අමතක කරන්නද? අවසන් වතාවට තිසර සූරියබණ්ඩාරගේ කාමරයෙන් පිටව තමා සොයාගිය අසංග කෙළෙස නම් අමතක කරන්නද? විකල්ව ගිය මනසින් ඔහු හා එක්ව මත්ද්‍රව්‍ය ශරීරගත් කරගත් සැටි කෙළෙසක නම් අමතක කරන්නද? ජීවිතයෙන් මගහැරී ගිය ඔහු මෙතරම් කටුක අත්දැකීමක් හරහා නැවත පැමිණියේ කෙළෙසකද?

“ඔයා දන්නවද මේ අසංග කියන එක්කෙනා..?” සිසිර දෙවන වතාවටද ඇසුවේය. ඔහුට පිළිතුරක් දෙන්නට අවශ්‍යය.

“මාත් එක්ක කැම්පස් එකේ හිටිය ළමයෙක්.. මට වඩා අවුරුද්දක් සීනියර්.. ඩිග්‍රි එක කම්ප්ලීට් කළේ නැහැ.. අයාලෙ ගියා.. ඩ්‍රග්ස් වලට පුරුදු වුණා.. අපරාදෙ”

“ඔය දෙන්න අතර සම්බන්ධයක් තිබුණාද?”

“සම්බන්ධයක්... මන්දා..” මදාරා කල්පනාවට වැටුණාය. තමන් අතර ප්‍රකාශිත ප්‍රේමයක් තිබුණිද? “..සම්බන්ධයක් කියල දෙයක් හරියකට තිබුණෙ නැහැ.. අනේ මන්දා.. අසංග ඒ දවස් වල මා ගැන ලොකුවට බාලපොරොත්තු තියන් හිටියා.. මං කැමැත්තක්වත් අකමැත්තක්වත් පෙන්නුවෙත් නැහැ.. ඒත් ඒව නිකම් හුළඟට ගිය දේවල් විතරයි.. කැම්පස් එකෙන් අවුට් වුණාට පස්සෙ මට කවදාකවත් එයා හමුවෙලා නැහැ..” මදාරා සුසුම් හෙලුවාය. “.. ඒ ළමය හරිම අහිංසකයි මිස්ටර් කුලසේකර.. මේ ගොතල තියෙන්නෙ හෙණ ගහන කතාවක්.. අපි හැම දෙනාම එකට ගැට ගහලා අහස පොළොව උහුලන්නෙ නැති මුසාවක් ලෝකෙටම කියනවා.. මේක හරිම අසාධාරණයි”

“අද සාධාරණත්වය කොහෙද තියෙන්නෙ මදාරා...” සිසිර කියන්නේ එපමණකි. මේ සාකච්ඡාව තව දුරටත් ගෙන ගොස් මදාරා වෙහෙසකරන්නට ඔහුට නොසිතුණි. “.. කල්පනාවෙන් වැඩ කරගන්න.. මේ හැම දෙයක්ම හරිම භයානකයි.. අපි හිතන දේ නෙවෙයි වෙන්නෙ.. බලය ඉස්සරහදි මිනිස්සු නොකරන දෙයක් නැහැ.. ඒක තේරුම් අරගන්න..”

“එතකොට මේ අසාධාරණය ගැන නිශ්ශබ්දව ඉන්න කියලද මිස්ටර් කුලසේකර කියන්නෙ..?”

“එහෙම නොකර ඔයා කා එක්කද මේක කතා කරන්නෙ? කාටද පැමිණිලි කරන්නෙ.. කවුද ඔයාගෙ පැමිණිල්ල අහන්න ඉන්නෙ..? අපට පැමිණිලි කරන්න තියෙන්නෙ හිස් අහස විතරයි මදාරා.. කෑගැහීමෙන් පැමිණිලි කිරීමෙන් වෙන යහපතක් නැහැ.. තවත් කරදර ගොඩක් දාගන්න එක විතරයි අන්තිමේදි වෙන්නෙ.. සාධාරණත්වයක් කියල දෙයක් තියෙන යහපත් සමාජයක් කවදාහරි ගොඩ නැගෙනකල් ඔයාල අපි වගේ පුංචි මිනිස-"සුන්ට තියෙන්න දෙන දෙයක් කාල වෙන දෙයක් බලාගෙන ඉන්න එක විතරයි..”

“මේක හරිම අසාධාරණයි” මදාරා නැවත මිමිණුවාය.

“ඒකම තමයි මාත් මේ කියන්නෙ.. මේක හරිම අසාධාරණයි” සිසිර කුලසේකර කීවේ වාඩි වී සිටි පුටුවෙන් නැගිටින අතරය. ආපසු හැරෙන්නට පෙර ඔහු මදාරා දෙස බැලුවේය. “..පහුගිය කාලෙ සිදුවෙච්ච දේවල් දිහා බැලුවම එක දෙයක් කියන්න පුලුවන්.. අසංග ගෙ ජීවිතේ තියෙන්නෙ අනතුරේ.” ඔහු කීවේ පහත් හඬින්ය.

000000000

හසන්ත තමා කියවමින් සිටි පුවත්පත විසිකර දැමුවේ කෝපයෙනි. මෙය මෙසේ සිදුවිය හැකි දැයි ඔහු තමාගෙන්ම අසා ගත්තේය. තමා ඇසුරු කරන මිනිසුන් මේ සා පහත් තත්වයක දෙයක් කරනු ඇතැයි ඔහු කිසිම විටෙක බලාපොරොත්තු නොවීය. තමාට සිදුව ඇති අපහාසය ඉවසා සිටිය

සඳක් හෝ අවම වශයෙන් තරුවක් හෝ නොතිබුණ අන්ධකාරයට එරෙහිව එක පහනක් හෝ දල්වන්නෙමැයි අදිටන් කරගෙන සිටි මිනිසා අන්ධකාර අවකාශය තුළ ම සිරව සිටියේය. අනර්ථයේ අනවබෝධයේ අවනීතියේ සහ අසාධ-ාරණයේ රකුසු ඇස් පමණක් ඒ අන්ධකාරය තුළ දැල්වී තිබෙනු නිරාශා දුටුවාය. ඒ කුරිරු ඇසින් ගැලවී ගැනීමට ශක්තිය හා ධෛර්යය තමා තුළ ඇතිද යන සැකය පවා ඇගේ සිත පීඩාවට පත් කළේය. ඔහු නැතිව කිසිවක් කළ නොහැකිය. එහෙත් ඔහු තවමත් ඒ සඳහා සූදානම් බවක් ඇයට නොපෙනෙයි. මේ කිසිවක් පිළිබඳව තැකීමක් නැත්තා සේ ඔහු තවමත් නිද්‍රාවක ගැලී සිටියි. බිඳෙන් බිඳ ඔහුගේ සිරුරට ඇතුල් වන සේලයින් දියරය යම් කිසි මොහොතක ඔහු මේ නිද්‍රාවෙන් පුබුදුවනු ඇතැයි ඈ සිතුවාය.

නිරාශාගේ කඳුළින් විදුලගේ උරහිස තෙමී ගියේය. ඔහු දැන් දැන් නැගිට තමාගේ හිස කෙස් අතරින් අතැඟිලි යවා තමා සනහනු ඇතැයි යන බලාපො-රොත්තුව පමණක් හිතේ තබාගෙන ඈ ඉකි බිඳිමින් සිටියාය. කාලය සහ පරිසරය පිළිබඳ කිසිදු නිනව්වක් නැතිව තමා කොපමණ වේලාවක් එසේ හඬමින් සිටින්නට ඇත්දැයි නිරාශා නොදැන සිටියාය.

මාධ්‍ය හරහා ප්‍රචාරය කෙරෙමින් ඇති අතිශය පිළිකුල් සහගත නින්දාව පිටුපස ඇති බලවේග හා අරමුණු ඇයට තේරුම් ගත හැකිය. ඇයට තේරුම් ගත නොහැකි කරුණ වූයේ බලවතුන් හා මෙතරම් සම්බන්ධයක් ඇති හසන්තගේ නම මේ කතාවට ඈඳා තිබීම පමණකි. ඔහුත් මේ කුමන්ත්‍රණයේම කොටස් කරුවකුද? ඔහුත් මේ සියල්ල දැන සිටියේද? සියල්ල ලෙහා ගත නොහැකි තරම් අවුල් ජාලාවක් බවට පත්ව තිබෙයි. ඒ අවුල තුළ ගිලී විනාශ නොවී සිටිය යුතු යයි ඇගේ සිත කියයි. ඒ සඳහා ශක්තිමත් විය යුතුය.

“අනේ නැගිටින්න විදුල... මට තනියෙන් මේව දරාගන්න බැහැ..” කියාගත නොහැකි ඒ වදන් සිත තුළ දෝංකාර දුන්නේය.